සුව පහසු දිවියක් සඳහා විදුලිය - 02

6 ශ්‍රේණිය

විදුලි පරිපථ

07.

විදුලිය ප්‍රයෝජනයට ගත හැකි වන්නේ අපට අවශ්‍ය උපකරණ තුළින් විදුලිය ගලා යාමට සැලැස්වූ විට ය.

විදුලිය ගලා යා හැකි වන සේ සකසන ලද ගමන් පථයක්, විදුලි පරිපථයක් ලෙස හැඳින්විය හැකි ය.

i. විදුලි පරිපථයක් ගොඩනැඟීමට අත්‍යවශ්‍යම දේවල් හතරක් ලියන්න.

- විද්‍යුත් ප්‍රභවයක්
- ක්‍රියාත්මක කිරීමට උපකරණයක්
- ස්විච්චියක්
- සන්නායක කම්බි

ii. විද්‍යුත් ප්‍රභව ලෙස යොදා ගත හැකි දෑ තුනක් නම් කරන්න.

- **විද්‍යුත් කෝෂ**
- **ඩයිනමෝ**
- **සූර්ය කෝෂ**

iii. විවිධ කාර්යයන් ඉටු කරගැනීම සඳහා පරිපථයකට සම්බන්ධ කළ හැකි උපකරණ පහක් සඳහන් කරන්න.

- බල්බය
- සරල ධාරා මෝටරය
- ඇමීටරය / මිලි ඇමීටරය
- වෝල්ට් මීටරය
- ප්‍රතිරෝධකය

iii. විදුලි පරිපථයක් ගොඩනැංවීමට යොදා ගත හැකි උපාංග කිහිපයක් පහත දැක්වේ. එම උපාංගය කුමක්දැ යි නම් කර පරිපථ සටහනක් ඇඳීමේදී එම උපාංගය නිරූපනය කළ හැකි සම්මත සංකේතය ඉදිරියෙන් ලියන්න.

a.

කෝෂය



a.

සන්නායක කම්බි

c.

ස්විච්චිය



d.

ඇමීටරය



e.

වෝල්ට් මීටරය



f.

බල්බය



g.

ගැල්වනෝ මීටරය



v. පහත උපකරණ හා සන්නායක කම්බි සම්බන්ධ කරමින් ආකාර දෙකකට බල්බ දැල්විය හැකි විද්‍යුත් පරිපථ දෙකක් ගොඩනඟන්න.එම පරිපථ දෙක සංකේත භාවිතයෙන් ඇඳ දක්වන්න.

a.





b.





vi. පහත දැක්වෙන පරිපථ සටහන් අධ්‍යයනය කොට ඒවායේ විදුලි උපාංග හඳුනාගන්න. සැබෑ උපකරණ භාවිතයෙන් ගොඩනැඟිය හැකි පරිපථය අඳින්න





08. විදුලිය ගමන් කරන ද්‍රව්‍ය සන්නායක ලෙසත්, විදුලිය ගමන් නොකරන ද්‍රව්‍ය පරිවාරක ලෙසත් හඳුන්වනු ලබයි.



i. AB අග්‍ර අතරට පහත ද්‍රව්‍ය තැබූ විට බල්බය දැල්වේද?නොදැල්වේද? යන බව සඳහන් කර ඒ අනුව එම ද්‍රව්‍ය සන්නායකද? නැතහොත් පරිවාරක ද යන බව වගුවේ දක්වන්න.

eneloop
eneloop
සන්නායක


eneloop
eneloop
පරිවාරක



ද්‍රව්‍ය	බල්බය දැල්වේ ද? /නොදැල්වේ ද?	සන්නායක ද? පරිවාරක ද?
කාසිය	බල්බය දැල්වේ	සන්නායක
ප්ලාස්ටික් කැබැල්ල		
වියලි කෝෂයක කාබන් කූර		
වීදුරු		
රබර්		
මිනිරන් කූර		
රසදිය		



ද්‍රව්‍ය	බල්බය දැල්වේ ද? /නොදැල්වේ ද?	සන්නායක ද? පරිවාරක ද?
කාසිය	බල්බය දැල්වේ	සන්නායක
ප්ලාස්ටික් කැබැල්ල	බල්බය නොදැල්වේ	පරිවාරක
වියලි කෝෂයක කාබන් කූර		
වීදුරු		
රබර්		
මිනිරන් කූර		
රසදිය		


eneloop
eneloop



ද්‍රව්‍ය	බල්බය දැල්වේ ද? /නොදැල්වේ ද?	සන්නායක ද? පරිවාරක ද?
කාසිය	බල්බය දැල්වේ	සන්නායක
ප්ලාස්ටික් කැබැල්ල	බල්බය නොදැල්වේ	පරිවාරක
වියළි කෝෂයක කාබන් කූර	බල්බය දැල්වේ	සන්නායක
වීදුරු		
රබර්		
මිනිරන් කූර		
රසදිය		


eneloop
eneloop



ද්‍රව්‍ය	බල්බය දැල්වේ ද? /නොදැල්වේ ද?	සන්නායක ද? පරිවාරක ද?
කාසිය	බල්බය දැල්වේ	සන්නායක
ප්ලාස්ටික් කැබැල්ල	බල්බය නොදැල්වේ	පරිවාරක
වියලි කෝෂයක කාබන් කූර	බල්බය දැල්වේ	සන්නායක
වීදුරු	බල්බය නොදැල්වේ	පරිවාරක
රබර්		
මිනිරන් කූර		
රසදිය		

6 ශ්‍රේණිය - සුව පහසු දිවියක් සඳහා විදුලිය





ද්‍රව්‍ය	බල්බය දැල්වේ ද? /නොදැල්වේ ද?	සන්නායක ද? පරිවාරක ද?
කාසිය	බල්බය දැල්වේ	සන්නායක
ප්ලාස්ටික් කැබැල්ල	බල්බය නොදැල්වේ	පරිවාරක
වියලි කෝෂයක කාබන් කූර	බල්බය දැල්වේ	සන්නායක
වීදුරු	බල්බය නොදැල්වේ	පරිවාරක
රබර්	බල්බය නොදැල්වේ	පරිවාරක
මිනිරන් කූර		
රසදිය		



ද්‍රව්‍ය	බල්බය දැල්වේ ද? /නොදැල්වේ ද?	සන්නායක ද? පරිවාරක ද?
කාසිය	බල්බය දැල්වේ	සන්නායක
ප්ලාස්ටික් කැබැල්ල	බල්බය නොදැල්වේ	පරිවාරක
වියලි කෝෂයක කාබන් කූර	බල්බය දැල්වේ	සන්නායක
වීදුරු	බල්බය නොදැල්වේ	පරිවාරක
රබර්	බල්බය නොදැල්වේ	පරිවාරක
මිනිරන් කූර	බල්බය දැල්වේ	සන්නායක
රසදිය		



ද්‍රව්‍ය	බල්බය දැල්වේ ද? /නොදැල්වේ ද?	සන්නායක ද? පරිවාරක ද?
කාසිය	බල්බය දැල්වේ	සන්නායක
ප්ලාස්ටික් කැබැල්ල	බල්බය නොදැල්වේ	පරිවාරක
වියලි කෝෂයක කාබන් කූර	බල්බය දැල්වේ	සන්නායක
වීදුරු	බල්බය නොදැල්වේ	පරිවාරක
රබර්	බල්බය නොදැල්වේ	පරිවාරක
මිනිරන් කූර	බල්බය දැල්වේ	සන්නායක
රසදිය	බල්බය දැල්වේ	සන්නායක

ii. සන්නායක ද්‍රව්‍ය එදිනෙදා ජීවිතයේ භාවිත කරන අවස්ථා පහක් සඳහන් කරන්න.

- විදුලි රැහැන් ලෙස යොදා ගැනීම.
- වාහනවල බැටරියේ සිට උපකරණය දක්වා විදුලි ගමන් මග සඳහා යොදා ගැනීම.
- විදුලි පරිපථ පැස්සීමට පාහන ඊයම් යොදා ගැනීම.
- විදුලිය තාවකාලිකව ගබඩා කරන ධාරිත්‍රකවල
- විදුලි පහන්වල ලෝහමය ආවරණය ලෙස

iii. පරිවාරක ද්‍රව්‍ය එදිනෙදා ජීවිතයේ භාවිත කරන අවස්ථා තුනක් සඳහන් කරන්න.

- විදුලි උපකරණවල අතින් අල්ලා ගන්නා කොටස සඳහා
- ඉලෙක්ට්‍රොනික උපකරණවල බාහිර ආවරණය ලෙස යොදා ගැනීම.
- සන්නායක රැහැන්වලට ආවරණයක් ලෙස යොදා තිබීම.

09. ඉලෙක්ට්‍රොනික උපකරණ කිහිපයක් සහ ඒවායේ අභ්‍යන්තරය දැක්වෙන රූපයක් පහත දැක්වේ.



i. ඉලෙක්ට්‍රොනික උපකරණ තුළ ඇති උපාංග වර්ග පහත නම් සොයා ලියන්න.

- ඩයෝඩ /ආලෝක විමෝචක ඩයෝඩ
- ට්‍රාන්සිස්ටර්
- සංගෘහිත පරිපථ හෙවත් IC
- ධාරිත්‍රක
- ප්‍රතිරෝධක

- **ඩයෝඩ**

Zener Diode
Anode
Flat
Cathode
Longer Lead
Gunn Diode
Laser Diode
Zener Diode
Light Emitting Diode
Types of Diode
projectiot123.com
Tunnel Diode
Photo Diode
Tunnel Diode
Varactor Diode
Schottky Diode
4007 Diode

- ට්‍රාන්සිස්ටර්



- සංගෘහිත පරිපථ හෙවත් IC



- **ධාරිත්‍රක**



- **ප්‍රතිරෝධක**

Surface Mount Resistors
Leaded Resistors
High Power & TO Type Resistors
High Voltage Resistors
Current Sense / Shunt Resistors
Precision Resistors
Custom Resistors
Wirewound Resistors
Pulse Withstanding Resistors

- **ප්‍රතිරෝධක**

ii. ඉලෙක්ට්‍රෝනික පරිපථ සඳහා භාවිතා වන සරලතම උපාංගයක් ලෙස ඩයෝඩය හැඳින්විය හැකිය



විවිධ ස්වරූපයෙන් යුතු ඩයෝඩ වෙළඳපළේ ඇති නමුත් බහුලවම පවතින ඩයෝඩ වර්ග වන්නේ LED සහ සෘජුකාරක ඩයෝඩ යි.

10. පහත රූප මගින් දැක්වෙන්නේ සෘජුකාරක ඩයෝඩ වේ.



විවිධ ස්වරූපයෙන් යුතු ඩයෝඩ වෙළඳපළේ ඇති නමුත් බහුලවම පවතින ඩයෝඩ වර්ග වන්නේ LED සහ සෘජුකාරක ඩයෝඩ යි.

i. ඩයෝඩයක කාර්යය කුමක්දැයි හඳුනාගැනීමට සිදුකළ ක්‍රියාකාරකමක් රූපයේ දැක්වේ.



රූපයේ ආකාරයට ඩයෝඩයේ රිදීපාට වළල්ල දෙපසට මාරු වන සේ A B අතරට තැබූ විට බල්බය දැල්වීම සම්බන්ධ නිරීක්ෂණය කුමක් වේ ද?

රිදී පාට වළල්ල කෝෂයේ ධන අග්‍රයට සම්බන්ධ වන සේ තැබූ විට



- බල්බය නොදැල්වේ.

රිදී පාට වළල්ල කෝෂයේ ඍණ අග්‍රයට සම්බන්ධ වන සේ තැබූ විට



- බල්බය දැල්වේ.

A අග්‍රයට LED යේ ධන ද, B අග්‍රයට LED යේ ඍණ ද වන සේ තැබූ විට නිරීක්ෂණ :



- බල්බය නොදැල්වේ.
- LED ය ද නොදැල්වේ.

A අග්‍රයට LED යේ සෘණ ද, B අග්‍රයට LED යේ ධන ද වන සේ තැබූ විට නිරීක්ෂණ :



- බල්බය නොදැල්වේ.
- LED ය දැල්වේ.

c. ඉහත නිරීක්ෂණ අනුව ඩයෝඩයක කාර්යය කුමක් ද?



පරිපථයක් තුළින් විදුලි ධාරාවක් එක් දිශාවකට පමණක් ගමන් කිරීමට ඉඩ සැලසීම.

d. ඩයෝඩයක සහ LED යක සම්මත සංකේතය අඳින්න.

d. වෙළඳපලේ LED ලබා ගත හැකි වර්ණයන් මොනවා ද?

- නිල්
- රතු
- සුදු
- කහ
- කොළ
- තැඹිලි

d. LED එදිනෙදා ජීවිතයේ භාවිත කරන අවස්ථාවන් සඳහා නිදසුන් පහක් දෙන්න

- මාර්ග සංඥා

- විදුලි පන්දමක් ලෙස



- උපකරණ තුළට අවශ්‍ය ආලෝකය ලබා ගැනීමට

- පරිගණක තිරය සඳහා



- විදුලි පහනක් ලෙස

why use LED ?
Low maintenance
Cost saving
Energy saving
Long lasting
Eco-friendly

11. විදුලිය ගමන් කිරීමට ඇතිවන බාධාව ප්‍රතිරෝධය ලෙසත්, ප්‍රතිරෝධයක් යොදමින් ධාරාව පාලනය කිරීමට යොදා ගන්නා උපාංග ප්‍රතිරෝධක ලෙසත් හඳුන්වනු ලබයි.

- වෙළඳපලේ විවිධ වර්ගවල ප්‍රතිරෝධක ඇත.



- ප්‍රතිරෝධක තුළින් විදුලිය ගමන් කිරීමේදී විදුලිය ගමනට බාධා පමුණුවන බව හඳුනාගැනීමට සිදු කළ ක්‍රියාකාරකමක ඇටවුමක් පහත දැක්වේ.



i. A B අතරට පහත එක් එක් ද්‍රව්‍ය තබනු ලැබේ. එවිට බල්බය දැල්වීම සම්බන්ධ නිරීක්ෂණ සඳහන් කරන්න.

- තඹ කම්බියක්,



✓ බල්බය දැල්වේ.

- වියළි කෝෂයකින් ගලවා ගත් කාබන් කූරක්,



✓ බල්බය දැල්වේ. දීප්තිය තරමක් අඩුවේ.

- වියලි කෝෂයකින් ගලවා ගත් කාබන් කූරු දෙකක්,



✓ බල්බය දැල්වේ. දීප්තිය තවත් අඩුවේ.

- වියලි කෝෂයකින් ගලවා ගත් කාබන් කූරු තුනක්,



✓ බල්බය දැල්වේ. දීප්තිය තව දුරටත් අඩුවේ.

- 1.0 Ω ප්‍රතිරෝධකයක්,



✓ බල්බය දැල්වේ. දීප්තිය තරමක් අඩුවේ.

- 2.2 Ω ප්‍රතිරෝධකයක්,



✓ බල්බය දැල්වේ. දීප්තිය තවත් අඩුවේ.

- 3.3 Ω ප්‍රතිරෝධකයක්,



✓ බල්බය දැල්වේ. දීප්තිය තවත් අඩුවේ.

- 4.7 Ω ප්‍රතිරෝධකයක්,



✓ බල්බය දැල්වේ. දීප්තිය තවත් අඩුවේ.

- 5.6 Ω ප්‍රතිරෝධකයක්,



✓ බල්බය දැල්වේ. දීප්තිය තවත් අඩුවේ.

- 10 Ω ප්‍රතිරෝධකයක්,



✓ බල්බය දැල්වේ. දීප්තිය ඉතාමත් අඩුවේ.

iii. ප්‍රතිරෝධය මැනීමේ සම්මත ඒකකය වචනයෙන් හා සංකේතයෙන් ලියන්න.

- ඕම්
- Ω

iv. පරිපථයක ප්‍රතිරෝධකයක් නිරූපණය කිරීමට යොදා ගන්නා සම්මත සංකේතය කුමක් ද?



12. ආලෝක සංවේදී ප්‍රතිරෝධක LDR ලෙස කෙටි යෙදුමකින් හඳුන්වනු ලැබේ. පහත දකුණු පැත්තේ ඇති රූපයෙන් දක්වා ඇත්තේ LDR එකකි.
වම් පසින් දක්වා ඇත්තේ LDR එකක සම්මත සංකේතය යි.



i. ආලෝක සංවේදී ප්‍රතිරෝධකයක ක්‍රියාකාරීත්වය හඳුනා ගැනීමට සකස් කළ ඇටවුම් දෙකක් පහත A හා B රූප මගින් දැක් වේ.



A ඇටවුම



B ඇටවුම

✓ පහත එක් එක් අවස්ථාවේදී නිරීක්ෂණ සඳහන් කරන්න.

i. A ඇටවුමෙහි ආලෝක සංවේදී ප්‍රතිරෝධකය මතට

- ආලෝකය වැටෙන විට



මිලි ඇමීටරයේ පාඨාංකය වැඩිවේ.

මිලි ඇමීටරයේ පාඨාංකය අඩුවේ.

i. A ඇටවුමෙහි ආලෝක සංවේදී ප්‍රතිරෝධකය මතට

- ආලෝකය වැටෙන විට
- අඳුර වැටෙන විට



LED ය දැල්වේ.

c. නිරීක්ෂණ අනුව ආලෝක සංවේදී ප්‍රතිරෝධකයක ක්‍රියාකාරීත්වය කෙබඳු වේ ද?

- ✓ ආලෝකය ලැබෙන විට LDR හි ප්‍රතිරෝධය අඩු වේ.
- ✓ අඳුර ඇති විට LDR හි ප්‍රතිරෝධය වැඩි වේ.

13. විදුලිය පරිභෝජනය එදිනෙදා ජීවිතයේ අනිවාර්ය අංගයක් බවට පත්ව ඇත.

විදුලිය පරිභෝජනයක් නොකළ එක් දිනක් හෝ ඔබට පැවසිය හැකි ද?

- විදුලිය පරිභෝජනය වැඩිවීම,
- විදුලි උත්පාදනය ප්‍රමාණවත් නොවීම.

" ගැටළුවකි. "

- විකල්ප විදුලි උත්පාදන ක්‍රම හඳුනාගෙන භාවිත කිරීම,
- තිබෙන විදුලිය අරපිරිමැස්මෙන් භාවිත කිරීම,

" **විසඳුමකි.** "

i. පහත අවස්ථාවලදී විදුලිය අරපිරිමැස්මෙන් භාවිත කිරීම සිදුකරන ආකාරය විස්තර කරන්න.

a. නිවෙස් ආලෝකමත් කිරීමට පහන් තෝරා ගැනීමේ දී,

- ✓ අවශ්‍යතාවයට ගැළපෙන වොට් අගය සහිත පහන් තෝරා ගැනීම.
- ✓ ශක්ති හානිය අවමවන පහන් තෝරා ගැනීම.

b. විදුලි උපකරණය භාවිත කිරීමෙන් පසු,

- ✓ ස්විච්චිය විවෘතව තැබීම/ කෙවෙනියෙන් පේනු ගළවා දැමීම.

c. ශබ්ද උපදවන විදුලි උපකරණ භාවිතයේ දී,

- ✓ අවශ්‍යතාවයට ගැළපෙන පරිදි හඬ පාලනය කිරීම.

d. **පරිගණක හා රූපවාහිනී භාවිතයේ දී,**

- ✓ LED **තිර සහිත පරිගණක හා රූපවාහිනී භාවිත කිරීම.**

ළ. ශීතකරණය භාවිත කිරීමේ දී,

- ✓ දොර විවෘතව තිබෙන කාලය අවම කර ගැනීම.
- ✓ උණුසුම් ආහාර පාන ශීතකරණයේ නොතැබීම.
- ✓ ශීතකරණය තුළ ඇති අවකාශ අවම කිරීම.
- ✓ බිත්තිය හා ශීතකරණය අතර ඉඩක් තැබීම.
- ✓ ශීතකරණය හිරු එළිය වැටෙන ස්ථානයක නොතැබීම.

f. විදුලි ස්ත්‍රික්කයෙන් රෙදි මැදීමේ දී,

- ✓ මැදීමට ඇති රෙදි වැඩි ප්‍රමාණයක්/සියල්ලම එකවර මැදීම.

ii. එදිනෙදා ජීවිතයේදී ඔබ වැරදි ආකාරයට /නොනිසි ආකාරයට විදුලිය භාවිත කළ අවස්ථා ලැයිස්තු ගත කරන්න.

a. පේනුවක් නොමැතිව කෙවෙනිය තුළට වයර් ඇතුළු කිරීම.



b. ස්විච්චිය විවෘත (OFF) නොකර දුරකථන චාජරය පේනුවට සම්බන්ධ කිරීම.

c. අකුණු ගසන අවස්ථාවල දී රූපවාහිනිය නැරඹීම.

ii. එදිනෙදා ජීවිතයේදී ඔබ වැරදි ආකාරයට /නොනිසි ආකාරයට විදුලිය භාවිත කළ අවස්ථා ලැයිස්තු ගත කරන්න.

a. පේනුවක් නොමැතිව කෙවෙනිය තුළට වයර් ඇතුළු කිරීම.

b. ස්විච්චිය විවෘත (OFF) නොකර දුරකථන චාජරය පේනුවට සම්බන්ධ කිරීම.

c. අකුණු ගසන අවස්ථාවල දී රූපවාහිනිය නැරඹීම.

d. ස්විච්චිය විවෘත (OFF) නොකර පේනුවලින් කෙවෙනි ගැළවීම

e. අත්වල ජලය තිබිය දී ස්විච්චිය (ON) සංවෘත කිරීම.

f. විදුලි රැහැන් අසල සරුංගල් යැවීම/සෙල්ලම් කිරීම

g. අකුණු ගසන වැසි දිනවල දී ස්ථාවර දුරකථනය භාවිත කිරීම.

iii. විදුලිය ප්‍රධාන විදුලිය හෙවත් ජව මූලික විදුලිය භාවිතයේදී අනතුරු සිදුවිය හැකිය. එමගින් සිදුවන අනතුරු වළක්වා ගැනීමට ඔබට අනුගමනය කළ හැකි පියවර සඳහන් කරන්න.

a. ස්විච්චිය විවෘත (OFF) කර විදුලි උපකරණ කෙවෙනියට සම්බන්ධ කිරීම.

b. විදුලි උපකරණ භාවිත නොකරන අවස්ථාවල දී කෙවෙනියෙන් පේනු ගලවා තැබීම.

c. රෙදි මදින විට වියලි පාවහන් පැළදීම හා කාර්ය අවසන් වූ වහාම කෙවෙනියෙන් විසන්ධි කිරීම.

d. ශීතකරණය විවෘත කළ හැකි ඉක්මණින් එහි දොර වසා දැමීම.

e. ස්විච්චිය විවෘත කර විදුලි උපකරණ කෙවෙනියෙන් ගැළවීම.

f. ජල පොම්පය ක්‍රියාත්මක කර ටැංකියට ජලය පිරෙන විට විදුලිය විසන්ධි කිරීම.

g. විදුලි රැහැනක් කඩා වැටී තිබුණහොත් වැඩිහිටියෙකු ට දැනුම් දීම.

h. අත් වියලි ව ඇති අවස්ථාවල දී පමණක් ස්විච්චිය සංවෘත/විවෘත කිරීම.

i. බහු පේනු සම්බන්ධ කර ඇති අවස්ථාවල දී උපකරණ ක්‍රියාත්මක නොවේ නම් ස්විච්චිය විවෘතව තැබීම.

j. බහු පේනුවලට දැරිය හැකි උපකරණ සංඛ්‍යාවක් පමණක් සම්බන්ධ කිරීම.

k. දෙකූරු පේනු සහිත උපකරණ නිවැරදි ලෙස කෙවනියට සම්බන්ධ කිරීම.

l. කාර්ය අවසන් කර ඉවත්ව යන විට ක්‍රියාත්මකව ඇති විදුලි පංකා, පහන් ආදියෙහි විදුලිය විසන්ධි කිරීම.

m. අකුණු සහිත දිනවල දී විදුලි උපකරණවල පේනු කෙවෙනිවලින් ගළවා තැබීම.

n. විදුලිය විසන්ධි වූ විට විදුලි උපකරණවල පේනු කෙවෙනිවලින් ගළවා තැබීම.

ඔව් , දැන් මට පුළුවන් !   **Yes, I Can !**

- ✓ එදිනෙදා ජීවිතයේදී විද්‍යුතය ප්‍රයෝජනයට ගන්නා අවස්ථා සඳහන් කිරීමට
- ✓ විදුලිය ජනනය කරන ප්‍රධාන ක්‍රම තුන සඳහන් කිරීමට
- ✓ විදුලි පරිපථයකට සම්බන්ධ උපාංග නම් කිරීමට
- ✓ විද්‍යුත් පරිපථයක උපාංග සම්මත සංකේත භාවිතයෙන් ඇඳ දැක්වීම ට
- ✓ සරල ක්‍රම භාවිතයෙන් විදුලිය ජනනය කිරීම ට

- ✓ පරිපථ සටහනකට අනුව සරල විද්‍යුත් පරිපථයක් ගොඩනංවා ක්‍රියාත්මක කිරීමට
- ✓ විද්‍යුත් සන්නායක හා විද්‍යුත් කුසන්නායක පරීක්ෂණාත්මකව හඳුනා ගැනීමට
- ✓ විද්‍යුත් සන්නායක සඳහා නිදසුන් ඉදිරිපත් කිරීම ට
- ✓ විද්‍යුත් කුසන්නායක සඳහා නිදසුන් ඉදිරිපත් කිරීම ට
- ✓ ඩයෝඩ, ආලෝක විමෝචක ඩයෝය, ප්‍රතිරෝධක, ආලෝක සංවේදී ප්‍රතිරෝධක නිරීක්ෂණයෙන් හඳුනා ගැනීමට

- ✓ ඩයෝඩය, ආලෝක විමෝචක ඩයෝඩය, ප්‍රතිරෝධකය, ආලෝක සංවේදී ප්‍රතිරෝධකය යන උපාංගවල ක්‍රියාකාරිත්වය පරීක්ෂණාත්මකව හඳුනා ගැනීමට

- ✓ විද්‍යුත් උපකරණ හා ඉලෙක්ට්‍රොනික උපකරණ භාවිතයේදී ආරක්ෂිතව හා විදුලිය අරපිරිමැස්මෙන් යුතුව භාවිත කළ යුතු බව පිළිගැනීම ට

සුව පහසු දිවියක් සඳහා විදුලිය

YES ! I CAN

ඉදිරිපත් කිරීම

එල්. ගාමිණි ජයසූරිය
ගුරු උපදේශක (විද්‍යාව)
වෙන්/කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය
ලුණුවිල.

සම්බන්ධීකරණය

අධ්‍යාපන අමාත්‍යංශය - විද්‍යා ශාඛාව